# "Inventor Champs"

## නවෝත්පාදන ප්‍රවේශයේ පාසල් වේදිකාව

### - වැඩසටහනේ සාරාංශය -

"Inventor Champs" නිර්මාණශීලී පාසල් දූවා දරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා ශ්‍රද්ධා මාධ්‍ය ජාලය එක්ව සංවිධානය කරන රූපවාහිනී වැඩසටහන යි. දරුවන් ගේ නවෝත්පාදන හැකියාවන් හඳුනාගනිමින් ඔවුන් නව නිපැයුම්කරණයෙහි දිරිගැන්වීමටත්, එතුලින් අප ගේ මාතෘභූමිය තුල නවනිපැයුම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට කටයුතු සැලැස්වීමත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණු අතර වේ.

දීපව්‍යාප්ත පාසල් නවෝත්පාදන වැඩසටහනක් ලෙස ක්‍රියාවට නැංවෙන "Inventor Champs" සඳහා ඉදිරිපත් වීමට 6 සිට 13 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනයෙහි නියැලෙන පාසල් දරුවන් හට දොරටු විවර වේ.

තරඟ විස්තර හා අයදුම්පත් www.slic.gov.lk වෙබ් පිටුව හරහා ඔබට ලබාගත හැක.

තරඟයට අයදුම් කළ හැකි අවසාන දිනය 2023 ජූනි 20 වේ.

දිවයිනම ආවරණය වන පරිදි හා සෑම පළාතක්ම නියෝජනය වන පරිදි, එමෙන්ම එක් පළාතකින් උපරිම සංඛ්‍යාව 20ක් වන අයුරින් නව නිපැයුම්/ නව සංකල්ප 180ක් මූලික අදියරේ දී තෝරාගනු ලබයි. එම නිපැයුම්/ නව සංකල්ප තාක්ෂණික ක්ෂේත්‍රය අනුව ප්‍රවීණයකු/ පාසල් ආචාර්යවරයෙකු වෙත අනුයුක්ත කෙරෙන අතර, එහිදී අවශ්‍ය අධීක්ෂණ කටයුතු මෙන්ම නිර්මාණයේ වැඩිදියුණු කිරීම සඳහා ද සහයෝගය ලබාදීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම කටයුතු සූදානම් කර ඇත.

එම නව නිපැයුම්/ නව සංකල්ප අතරින් විශිෂ්ට තත්ත්වයේ පවතින නිර්මාණ 90ක් තෝරාගැනෙන අතර, "Inventor Champs" රූපවාහිනී වේදිකාවට පිවිසීමට එම නිර්මාණ වරම් ලබයි.

මෙලෙස සුදුසුකම් ලබන දරුවන් සඳහා රූපවාහිනී තිරය සමඟ කටයුතු කළ යුතු ආකාරය මෙන්ම ස්වකීය හැකියාවන් අභිප්‍රේරණයට සහාය වන "කුසලතා සංවර්ධන වැඩසටහනක්" (Presentation Skills Development Workshop) ද පවත්වනු ලබයි.

තෝරාගනු ලබන නව නිර්මාණ 90 මැදිරි කටයුතු සඳහා යොමුවීමට ප්‍රථම බුද්ධිමය දේපළ අයිතිය (පේටන්ට්) ආරක්ෂා කිරීම සඳහා පියවර ගැනීම අනිවාර්ය අංගයක් වන අතරම, ඒ සඳහා ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සහයෝගය දරුවන්ට හිමි වේ.

මූලික වටය සහ අවසන් පූර්ව තරඟ වටයන් හරහා අවසන් තරඟයට නව නිපැයුම් 10ක් තෝරා ගන්නා අතර, අවසන් තරඟයේ දී ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන වශයෙන් විශිෂ්ටතම නව නිපැයුම් තෝරාගනු ලබයි.

මෙම තරඟය හරහා දරුවන් හට පොදුවේ හිමි වන ප්‍රතිලාභයන්ට අමතරව ජයග්‍රාහකයින් වෙනුවෙන්,

- මුදල් ත්‍යාග, කුසලාන සහ සහතික පත්
- වාණිජකරණයට අවශ්‍ය සහයෝගයන් ලබා දී ව්‍යවසායක අවස්ථාවන් දක්වා ගෙන යාම
- තාක්ෂණික බීජෞෂණාගාර පහසුකම්
- තාක්ෂණික දැනුම ඉහළ නංවාගැනීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් .. යනාදී වරප්‍රසාද ද හිමි වේ.

ඔබත් අදම අයදුම් කරන්න. ඔබ සමඟ පසුගමන් යමින් ඔබ ගේ නිර්මාණශීලීත්වය ගොඩනැංවීමට අප නිරන්තරයෙන් සැදී පැහැදී සිටින්නෙමු.

වැඩිදුර තොරතුරු සඳහා විමසීම්:

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
5 වන මහළ, "මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල,
නාරාහේන්පිට,
කොළඹ 05.

දුරකථන: 0112-676650
ෆැක්ස්: 0112-676646
විද්‍යුත් තැපැල: info@slic.gov.lk
වෙබ්: www.slic.gov.lk